තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

ගුරු මාර්ගෝපදේශය

8 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ)

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

www.nie.lk

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

8 ශ්‍රේණිය - ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය

© ජාතික අධ්‍යාපන ආයතනය

පළමු මුද්‍රණය **2018**

ISBN:

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

www.nie.lk

මුද්‍රණය :

අන්තර්ගතය	පිටු අංකය
අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය	iv
විෂයමාලා කමිටුව	v
හැඳින්වීම	vi
පොදු ජාතික අරමුණු	vii
මූලික නිපුණතා	viii - ix
විෂය අභිමතාර්ථ	x
වාර අනුව යෝජිත නිපුණතා මට්ටම්	xi
විෂය නිර්දේශය	1 -4
ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය	5
ගුරු මාර්ගෝපදේශය	6 – 69
පාරිභාෂික ශබ්දමාලාව	70 - 86

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණු සහිතව එවකට පැවැති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු වන අදියර, වර්ෂ2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ විවිධ පාර්ශ්ව ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන විෂයමාලා තාර්කීකරණය ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ විය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු විෂයවල නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සමෝධාන ක්‍රමය භාවිත කර ඇති අතර, විවිධ විෂයවල දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සමෝධාන ක්‍රමය භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථකව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායි ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදුම් හා ක්‍රියාකාරකම් තෝරාගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මේ ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායි වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී, සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් ප්‍රායෝගික ලෝකයට අවශ්‍ය නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, මෙම ලේඛන සැකසීමේ දී දායකත්වය දුන් සියලු සම්පත් දායකයන් හා වෙනත් පාර්ශ්වවල ද ඉමහත් කැප වීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

විෂයමාලා කමිටුව

මාර්ගෝපදේශනය සහ අනුමැතිය	ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ජාතික අධ්‍යාපන ආයතනය
විෂයය සම්බන්ධීකරණය	එම්.එන්.පී. මද්දුමගේ මිය කථිකාචාර්ය ජාතික අධ්‍යාපන ආයතනය

සම්පත් දායකත්වය

ඩී. අනුර ජයලාල් මහතා	අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
එස්. ෂන්මුගලිංගම් මයා	ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
එම්.එන්.පී. මද්දුමගේ මිය	කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
ජී.ඩී.ඩබ්.එම්. ආරියරත්න මිය	සහකාර කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය
ආචාර්ය පී.එම්.ටී.බී. සන්දිරිගම මයා	ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය එච්.එල්. ප්‍රේමරත්න මයා	ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
ආචාර්ය බී. රිස්කාන් මයා	කථිකාචාර්ය, මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, පොල්ගොල්ල
පී.එන්.ඩබ්.එල්.කේ. ප්‍රේමරත්න මෙය	ගුරු සේවය, උසස් බාලිකා විද්‍යාලය, මහනුවර
එම්. ඉන්ද්‍රපාලන් මයා	ගුරු සේවය, මනිපායි හින්දු
ඩී. විජේසේන මිය	ගුරු සේවය, ආවේ මරියා කන්‍යාරාමය, මීගමුව
ඒ.පී.එන්. ද සිල්වා මිය	ගුරු සේවය, මාර/ ජේ.ආර්.එස්. ද අල්මේදා ම. වි., අකුරැස්ස
පී.එච්. සිරානි මෙය	ගුරු සේවය, මාර/ අතුරලිය ම. වි.
එස්. සර්වේස්වරන් මයා	ගුරු සේවය, ව/ සිවප්‍රගාස කාන්තා විද්‍යාලය, වව්නියාව
කේ.බී.අයි. විජයරත්න මිය	තොරතුරු තාක්ෂණ උපදේශක, මයුරපාද ම. ම. වි
ඒ.ජී.ජී.යූ. ප්‍රේමලාල් මයා	ගුරු සේවය, කෑ/ බස්නාගල ම. වි, නුරිය
එන්.ඩී. සමරසිංහ මෙය	මධ්‍යස්ථාන කළමනාකරු, පරිගණක සම්පත් මධ්‍යස්ථානය, බ/ආනන්ද ම.ම.වි. හල්දුම්මුල්ල
වයි.ඩී.වී. පතිරණ මිය	විශ්‍රාමික ගුරු උපදේශක
පී. ප්‍රමිලා මිය	ගුරු සේවය, රාජකීය විද්‍යාලය, කොළඹ 07
ඒ.එම්. වසීර් මයා	මධ්‍යස්ථාන කළමනාකරු, පරිගණක සම්පත් මධ්‍යස්ථානය, කහගොල්ල ම.ම.වි, දියතලාව
පී.ඒ.කේ.ඒ.කේ. පණ්ඩිතරත්න මෙය	ගුරු සේවය, මලියදේව විද්‍යාලය, කුරුණෑගල

භාෂා සමීක්ෂණය

ජයත් පියදසුන්	නියෝජ්‍ය ප්‍රධාන උපකර්තෘ, සිළුමිණ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ආයතනික කටයුතුවල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මෙන් ම පුද්ගලයන්ගේ දෛනික කටයුතු සඳහා ද භාවිත කළ හැකි මෙවලමක් ලෙස ලොව පුරා හඳුනා ගෙන ඇත. එබැවින් විවිධ අධ්‍යාපන මට්ටම්වල දී සිසුන්ට තොරතුරු තාක්ෂණ දැනුම හා කුසලතා ප්‍රමාණවත් අන්දමකට ලබා දීම, ඔවුන්ට ජාතික සංවර්ධනයට හා ප්‍රගතියට දායකත්වය දැක්වීම සඳහා වැදගත් වේ.

අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාවේ අංගයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, අ.පො.ස. (සා.පෙ.) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා 12 වන ශ්‍රේණියේ GIT ඇතුළු විවිධාකාර විෂයයන් මගින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන පද්ධතිය, තොරතුරු සන්නිවේදන තාක්ෂණයට හරවත් ලෙස අනාවෘත වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නිපුණතා ප්‍රගතිය පවත්වාගෙන යැම සඳහා 6 සිට 9 ශ්‍රේණිය දක්වා තොරතුරු තාක්ෂණ විෂයය ඉගැන්වීම අත්‍යවශ්‍ය වී තිබේ.

6 සිට 9 ශ්‍රේණිය දක්වා වයස නිර්මාණාත්මක අධ්‍යයන අවධියක් වන බැවින් පරිගණකයෙහි සෛද්ධාන්තික අංශවලට වඩා සිසුන්ට ප්‍රායෝගික ක්ෂේත්‍රයන් ඉගැන්වීම මගින් කුතුහලය සහ අභිප්‍රේරණය නැංවීම යෝග්‍ය ය. එබැවින් සෛද්ධාන්තික හා ප්‍රායෝගික ක්ෂේත්‍ර අතර සමබරතාවක් ඇති ගත යුතුය. මේ සමබරතාව සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන තාක්ෂණය අන්තර්ගත කර ඇත.

සෛද්ධාන්තික හා ප්‍රායෝගික ක්ෂේත්‍ර අතර සමබරතාවක් ඇති කර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යයන කටයුතු සඳහා අත්තිවාරම දැමීම පිණිස තොරතුරු සන්නිවේදන තාක්ෂණ දැනුම එදිනෙදා ප්‍රායෝගික අවස්ථාවලදී භාවිත කිරීම මඟින් තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සහ අන්තර්ජාතික ප්‍රමිතිවලට අනාවෘත කිරීම කෙරෙහි විෂය නිර්දේශ කමිටුවේ අවධානය යොමු කර තිබේ.

පොදු ජාතික අරමුණු

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මගින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ විශිෂ්ට දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යැමට සහාය වීම

4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය

5. සුසමාහිත සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලි චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායකවන ඵලදායි කාර්ය සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය

8. අන්තර්ජාතික ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය

ජාතික අධ්‍යාපන කොමිසම් වාර්තාව (2003)

මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා පෙර සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i.) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, චිත්‍රක භාවිතය සහ තොරතුරු තාක්‍ෂණ නිපුණතා යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කතා කිරීම, අවබෝධය සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතා : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(ii.) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලි බව, අපසාරි චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගි බුද්ධිය

(iii.) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

සමාජ පරිසරය: ද අවබෝධයජාතික උරුම පිළිබ, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය: සජීව ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදි බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුවපහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්‍ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv.) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V.) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා, එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

(vi.) ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii.) **'ඉගෙනීමට ඉගෙනීම' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙක මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලි මගින් වෙනස් වීම් හසුරුවා ගැනීමේදී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය දීම.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයේ අරමුණු

මෙම විෂය නිර්දේශය මඟින් සිසුන්ට:

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත්වලට ප්‍රවේශ වීමට ප්‍රයෝජනවත් වන මූලික හැකියාවන් සංවර්ධනය කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් භාවිතය සඳහා වන මූලික හොඳ පුරුදු හුරු වීම
- මූලික පරිගණක සාක්ෂරතාවක් ඇති කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය අඛණ්ඩව හැදෑරීමට අවශ්‍ය පදනම ලබාදීම

අරමුණු කෙරේ.

වාර අනුව යෝජිත නිපුණතා මට්ටම්

වාරය	නිපුණතා මට්ටම්	කාලච්ඡේද සංඛ්‍යාව
පළමුවන වාරය	1.1, 1.2	05
	2.1, 2.2	04
	3.1	01
දෙවන වාරය	3.1,	05
	4.1,4.2	05
තෙවන වාරය	4.2,	02
	5.1, 5.2,	05
	6.1, 6.2	03
එකතුව		30

8 ශ්‍රේණිය විෂය නිර්දේශය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය				
නිපුණතාව	**නිපුණතා මට්ටම**	**අන්තර්ගතය**	**ඉගෙනුම් පල**	**කාලච්ඡේද ගණන**
1. උපදෙස් හා දත්ත පරිගණකයේ නිරූපණය කරන්නේ කෙසේ දැයි විමර්ශනය කරයි.	1.1 දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත්, ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි.	• සංඛ්‍යා පද්ධති හැඳින්වීම ○ දශමය සංඛ්‍යා හා ද්විමය සංඛ්‍යා පද්ධති ○ දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය ○ ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය	i. 10 සහ 2 පාද පදනම් කර ගෙන සංඛ්‍යා පද්ධති විස්තර කරයි. ii. දශමය නිඛිල සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත්, ද්විමය සංඛ්‍යා දශමය නිඛිල සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි.	03
	1.2 පරිගණකයේ ක්‍රියාකාරි තර්කනය (ද්විමය සංකල්ප) අගය කරයි.	• 0 සහ 1 භාවිතයෙන් දත්ත නිරූපණය කිරීමේ ක්‍රමය • පරිගණක සංරචක අතර දත්ත ද්විමය ආකාරයෙන් ගලා යෑම	i. ධන දශමය නිඛිල සංඛ්‍යා ද්විමය සංඛ්‍යා මඟින් නිරූපණය කරයි. ii. දෘශ්‍ය ඒකකය මත "A" අක්ෂරය (අක්ෂර සංඛ්‍යා, සංකේතාත්මක) හෝ ප්‍රතිබිම්බ (bitmap) භාවිතයෙන් ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමය විස්තර කරයි.	02

2. මෙහෙයුම් පද්ධතිය සමඟ කාර්යක්ෂමව හා ඵලදායීව පරිගණක භාවිත කරයි.	2.1 සැකසුම් කිරීම සහ වින්‍යාසකරණය (configuring) සඳහා මෙහෙයුම් පද්ධති භාවිත කරයි.	• ප්‍රදේශීය සැකසීම; දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති • ගොනු ගුණාංග • ගොනු සෙවීම	i. සැකසුම් කිරීම: දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති සැකසුම් කරයි. ii. ගොනු ගුණාංග සැකසීම: පඨනමාත්‍ර, සැඟවුණු, පිහිටීම, ප්‍රමාණය සැකසුම් කරයි. iii. දිගුව (extension) උපයෝගී කර ගොනු සොයයි.	02
	2.2 පරිගණකවල මූලික දෝෂාවේක්ෂණය සහ නඩත්තු කිරීමේ ක්‍රමවේද ගවේෂණය කරයි.(දෘඩාංග සහ මෘදුකාංග)	• සරල පරිගණක දෝෂ ගවේෂණය • දෘඩාංග දෝෂ (යතුරු පුවරු, මූසික, විදුලිබල රැහැන්, ජාලකරණ රැහැන්, VGA රැහැන්) • ශබ්ද ප්‍රතිදාන දෝෂ (ස්පීකර් සම්බන්ධතාව, ශබ්ද ප්‍රමාණය පිරික්සීම) • කෙවෙනි සම්බන්ධ කිරීම (PS/2, USB, Micro USB VGA, HDMI, Parallel, RJ45, Memory Card Reader) • පරිගණක මෘදුකාංග දෝෂ ගවේෂණය කර අදාළ දෝෂ විසඳීම • දෝෂ සහිත මෘදුකාංග • හිස් ඩෙස්ක්ටොප්	i. දෘඩාංග දෝෂ ගවේෂණය කර අදාළ දෝෂ විසඳීම සිදු කරයි. ii. මෘදුකාංග දෝෂ ගවේෂණය කර අදාළ දෝෂ විසඳීම සිදු කරයි.	02

3. එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි.	3.1 ලේඛනයක් සකස් කිරීමේ දී වදන් සැකසුම් මෘදුකාංගයන්ගේ මූලික ක්‍රියාකාරකම් භාවිත කරයි.	• ලේඛනයක් පිළියෙල කිරීම, විවෘත කිරීම, ගබඩා කිරීම සහ වැසීම • පාඨ හැඩසව් කිරීම • පාඨ, චිත්‍රක, හැඩ, clip art, word art,… ආදි ගොනු/ වස්තු ඇතුළත් කිරීම • වගුවක් ඇතුළත් කිරීම • අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ දෝෂ පරීක්ෂා කිරීම • ලැයිස්තු	i. වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් හැඩසව් ගන්වන ලද ලේඛනයක් පිළියෙල කරයි.	06
4. අනුක්‍රමය, තේරීම, පුනර්කරණය සහිත සරල ගැටලු විසඳීමට ගැලීම් සටහන් භාවිත කරයි. (Scratch භාවිතය)	4.1 ගැටලුව විශ්ලේෂණය කරයි.	• ආදාන, සැකසීම සහ ප්‍රතිදාන පියවර හඳුනා ගැනීම • ජංගම සහ සුහුරු උපාංග (Smart devices) සඳහා සැකසූ යෙදුම් හඳුනා ගැනීම • ගැලීම් සටහන් භාවිතයෙන් විසඳුම් ප්‍රලේඛනය	ii. එදිනෙදා ජීවිතයේ සරල ගැටලු විශ්ලේෂණය කරයි. iii. කැටි සටහන් මඟින් ගැටලු විස්තර කරයි. iv. ජංගම සහ සුහුරු උපාංගවල යෙදවුම් විස්තර කරයි.	02
	4.2 ක්‍රමලේඛ සංවර්ධනය සඳහා පාලන ව්‍යූහයන් භාවිත කරයි.	• සරල ඇල්ගොරිතම සහ තේරීම් පාලන ව්‍යූහයන් හැඳින්වීම • පරිගණක භාෂාවන්ගේ (අතුරු මුහුණත් භාවිතය) දෘශ්‍ය ආධාරක භාවිතයෙන් සරල වැඩසටහනක් (අනුක්‍රමය සහ තේරීම) පිළියෙළ කිරීම	i. පාලන ව්‍යූහයන් විස්තර කරයි. (තේරීම පමණි) ii. එදිනෙදා ජීවිතයේ සරල ගැටලු විසඳීමට පාලන ව්‍යූහයන් යොදා ගනියි.	05

5. ක්‍රමලේඛ තර්ක ක්‍රියාත්මක කිරීමට, භෞතික ආගණනය (computing) සඳහා වන මෘදුකාංග පැකේජ භාවිත කරයි.	5.1 භෞතික ආගණනය ක්‍රියාත්මක කිරීම සඳහා සරල දෘඪාංග උපාංග භාවිත කරයි.	• භෞතික ආගණන සංරචක • පාලන ව්‍යූහ භාවිතය: පුනර්කරණය (පුනරුක්තිය) • LED බල්බ දැල්වීම හා නිවීම • සරල පරිගණක ක්‍රමලේඛ භාවිතයෙන් LED බල්බ දල්වන රටා සැකසීම	i. තාර්කික මට්ටම් (ඔව්/ නැත) භාවිතයෙන් බාහිර පරිපථ ක්‍රියාත්මක කරවීමට ක්‍රමලේඛ ලියයි. ii. භෞතික උපක්‍රම සඳහා ක්‍රමලේඛ ක්‍රියාත්මක කරයි. උදාහරණ: අගයයන් ලබා දෙමින් LED බල්බ දැල්වීම/ නිවීම සිදු කරයි.	05
6. අන්තර්ජාලය භාවිතයෙන් අධ්‍යාපන තොරතුරු ගවේෂණය කරයි.	6.1 අන්තර්ජාලයේ තොරතුරු සොයයි.	• සෙවුම් යන්ත්‍ර : Google, Yaho, ... ආදි • අධ්‍යාපන අතරික්සු	i. සෙවුම් යන්ත්‍ර හඳුනා ගනියි. ii. අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය කරයි.	01
	6.2 උසස් ලක්ෂණ සහිත සරල වෙබ් අඩවි නිර්මාණය කරයි.	• උසුලන, මූලිකාංග, ගුණ, පාඨ හැඩසවි ගැන්වීම යනාදිය • අධිසම්බන්ධකවල උසස් ගුණාංග	i. පිරිවිතර අනුව වෙබ් අඩවි පිරිසැලසුම් කරයි. ii. පිරිසැලසුම අනුව වෙබ් අඩවි නිර්මාණය කරයි.	02
එකතුව				30

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ශීඝ්‍රයෙන් වෙනස් වන විෂයයකි. එමෙන්ම සිසුහු නවීන තාක්ෂණය භාවිත කිරීමට මහත් උනන්දුවක් දක්වති. ප්‍රායෝගික අභ්‍යාස භාවිතයෙන් සෑම සිසුවකුටම අත්දැකීම් ලබා දීම මෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් න්‍යායාත්මක පදනම සැකසීමට ඔවුන්ට ඉඩ සලසා දිය යුතුය.

මෙම විෂයය ඉගැන්වීම සඳහා යෝජිත ක්‍රමය ශිෂ්‍ය කේන්ද්‍රගත විය යුතු ය. ස්වයං අධ්‍යයනය සඳහා ශිෂ්‍යයා ධෛර්ය මත් කිරීම සඳහා විශේෂ අවධානයක් අවශ්‍ය වේ. අනෙකුත් විෂයන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය වැඩි දියුණු කර ගැනීම සඳහා සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය මගින් ලබා ගන්නා ලද නිපුණතා යොදා ගැනීමට ශිෂ්‍යයා යොමු කරන්න.

විෂයය සම්බන්ධ ප්‍රායෝගික සමාජ වටිනාකම් සහ නෛතික බාධා ඔවුනට දැනීමට සැලැස්වීම අත්‍යවශ්‍ය වේ. පරිගණක භාවිතයේ වැදගත්කම අවධාරණය කිරීම සඳහා ඉගෙනුම්-ඉගැන්වීමේ ඇගයීම් ක්‍රමවේදය සංවිධානය කර තිබේ.

තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය ඔස්සේ තොරතුරු සොයා බැලීමට සහ නව සොයා ගැනීම්වලට සහාය දැක්විය යුතු වන අතර, නව කටයුතු සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට ශිෂ්‍යයන් උනන්දු කළ යුතු ය.

නිපුණතාව 1 : උපදෙස් හා දත්ත පරිගණකයේ නිරූපණය කරන්නේ කෙසේ දැයි විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1: දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත්, ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි.

කාලය : කාලච්ඡේද 03

ඉගෙනුම් පල

- 10 සහ 2 පදනම් කර ගෙන සංඛ්‍යා පද්ධති විස්තර කරයි.
- දශමය පූර්ණ සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත් ද්විමය සංඛ්‍යා දශමය පූර්ණ සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි.

අන්තර්ගතය:

- සංඛ්‍යා පද්ධති සඳහා හැඳින්වීම
  - දශමය සහ ද්විමය සංඛ්‍යා පද්ධති
  - දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය
  - ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය

අවධානය යොමු කළ යුතු වදන් සහ සංකල්ප:

- සංඛ්‍යා පද්ධති
- ද්විමය සංඛ්‍යා
- දශමය සංඛ්‍යා
- දශමය සංඛ්‍යා පද්ධතියේ පදනම 10 වන අතර අංක 0 සිට 9 දක්වා අංක 10ක් භාවිත කරයි
- ද්විමය සංඛ්‍යා පද්ධතියේ පදනම 2 වන අතර අංක 0 සිට 1 දක්වා අංක 2ක් භාවිත කරයි
- දශමය සහ ද්විමය සංඛ්‍යා පරිවර්තනය

පාඩම් සැලසුම් සඳහා මග පෙන්වීම

- දශමය සංඛ්‍යාවන්හි ස්ථානීය අගය
- ඉහත ව්‍යූහය භාවිත කරමින් ද්විමය සංඛ්‍යා පද්ධතියක් ගොඩ නැංවීම
- දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය කරන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න.
- ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය කරන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා මාර්ගෝපදේශ:

- දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත්, ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවටත් පරිවර්තනය හුරු වීම සඳහා ප්‍රමාණවත් ප්‍රශ්න ලබා දෙන්න.

ගුණාත්මක යෙදවුම්

- ගණක රාමුව, අන්තර්ජාල පහසුකම්, සංඛ්‍යා පද්ධති පිළිබඳ සමර්පණ
- https://www.includehelp.com/computer-number-systems.aspx

කියවීම් ද්‍රව්‍ය

දශමය සංඛ්‍යා සහ ස්ථානීය අගය

දශමය සංඛ්‍යා 0 සිට 9 දක්වා වූ අගයන් දහයකින් පමණක් සමන්විත වේ. මෙම සංඛ්‍යා පද්ධතියේ සෑම අගයක්ම 0,1,2,3,4,5,6,7,8 සහ 9 මගින් නිරූපණය වන අතර සංඛ්‍යාංක 10 ක් ඇති බැවින් මෙම සංඛ්‍යා පද්ධතියේ පදනම 10 වේ.

මෙහිදී ස්ථානීය අගයන් හඳුනා ගැනීම සඳහා ඇබකසය භාවිත කළ හැකි ය.



රූපය 1.1.1 162 සංඛ්‍යාවෙහි ස්ථානීය අගයයන්

ද්විමය සංඛ්‍යා

ද්විමය සංඛ්‍යා පද්ධතිය තුළ 1 සහ 0 යන සංඛ්‍යාංක දෙක පමණක් පවතින බැවින් එහි පාදය 2 වේ.

Binary Base = 2

	Column 8	Column 7	Column 6	Column 5	Column 4	Column 3	Column 2	Column 1
Base^{exp}	2^7	2^6	2^5	2^4	2^3	2^2	2^1	2^0
Weight	128	64	32	16	8	4	2	1

$2^0 = 1$

$2^1 = 2$

$2^2 = 2 \times 2 = 4$

$2^3 = 2 \times 2 \times 2 = 8$

$2^4 = 2 \times 2 \times 2 \times 2 = 16$

$2^5 = 2 \times 2 \times 2 \times 2 \times 2 = 32$

$2^6 = 2 \times 2 \times 2 \times 2 \times 2 \times 2 = 64$

$2^7 = 2 \times 2 \times 2 \times 2 \times 2 \times 2 \times 2 = 128$

රූපය 1.1. 2 ද්විමය සංඛ්‍යාවල ස්ථානීය අගයයන්

දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය

1. සංඛ්‍යාව දෙකෙන් බෙදන්න
2. ඊළඟ බෙදීම සඳහා පූර්ණ සංඛ්‍යාමය ලබ්ධිය (පිළිතුර) ලබා ගන්න.
3. සංඛ්‍යාවේ ශේෂය (ඉතිරිය) දකුණු පසින් සටහන් කරන්න.
4. පිළිතුර 0ට සමාන වන තුරු පියවර නැවත ක්‍රියාත්මක කරන්න.



රූපය 1.1.3 දශමය 19 ද්විමය සංඛ්‍යාවකට පරිවර්තනය

ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය

1. ද්විමය සංඛ්‍යාව සටහන් කරන්න.
2. දෙකෙහි බල දකුණේ සිට වමට සටහන් කරන්න.
3. ද්විමය සංඛ්‍යාවේ එක් එක් සංඛ්‍යාංකය ඊට අදාළ බල ඉදිරියෙන් සටහන් කරන්න.
4. ද්විමය සංඛ්‍යා ඒවායේ අනුරූප බලය සමඟ සම්බන්ධ කරන්න.
5. දෙකේ බලවල අදාළ අවසාන අගය සටහන් කරන්න.



රූපය 1.1.4 ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍ය බවට පරිවර්තනය

නිපුණතාව 1 : උපදෙස් හා දත්ත පරිගණකයේ නිරූපණය කරන්නේ කෙසේ දැයි විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.2 : පරිගණකයේ ක්‍රියාකාරි තර්කණය (ද්විමය සංකල්ප) අගය කරයි.

කාලය : කාලච්ඡේද 02

ඉගෙනුම් පල :

- ධන දශමය පූර්ණ සංඛ්‍යා ද්විමය සංඛ්‍යා මගින් නිරූපණය කරයි.
- දෘශ්‍ය ඒකකය මත "A" අක්ෂරය (අක්ෂර සංඛ්‍යා, සංකේතාත්මක) හෝ ප්‍රතිබිම්බ (bitmap) භාවිතයෙන් ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමය විස්තර කරයි.

අන්තර්ගතය

- 0 සහ 1 යොදා ගනිමින් දත්ත නිරූපණය කරන ක්‍රමය
- පරිගණක සංරචක අතර දත්ත ද්විමය ආකාරයෙන් ගලා යෑම

අවධානය යොමු කළ යුතු වදන් සහ සංකල්ප:

- දත්ත නිරූපණය
- ද්විමය දත්ත ගලා යෑම

පාඩම් සැලසුම් සඳහා මග පෙන්වීම

- පරිගණකය මගින් ලොව දකිමු
- බිටු, බයිට සහ ද්විමය
- දත්ත නිරූපණය
  - පරිගණකය තුළ පාඨ (text) නිරූපණය
  - පරිගණකය තුළ පින්තූර නිරූපණය
  - බිටුමත පදනම්වූ පින්තූර
  - පරිගණකය තුළ වර්ණ නිරූපණය
  - පරිගණකය තුළ හඬ නිරූපණය

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ආදානය කරනු ලබන සංඛ්‍යාවක් ද්විමය බවට පරිවර්තනය කිරීම සඳහා පරිගණකය කුමන අවස්ථාවේ කවර ආකරයකින් ආකෘතියක් ලෙසට යොදා ගනු ලබන්නේද යන්න විස්තර කරන්න. එක් තැනක සිට තවත් තැනකට දත්ත ගමන් කරනු ලබන ආකාරය නාට්‍යයක කොටසක් ආකාරයෙන් සිදු කළ හැකිය.

ගුණාත්මක යෙදවුම්:

- බල්බ භාවිත කරමින් බිටු සහ බයිට ප්‍රමාණයේ ආකෘතියක්
- කළු සහ සුදු කඩදාසි භාවිත කරමින් හස්තමය ආකාරයෙන් නිර්මාණය කරන ලද සරල බිටු මත පදනම් වූ පින්තූරයක්
- https://www.quora.com/How-does-the-computer-understands-images-and-audios
- https://www.cs.cmu.edu/~fgandon/documents/lecture/uk1999/binary/HandOut.pdf

කියවීමේ ද්‍රව්‍ය

පරිගණකය මගින් ලොව දකිමු

තොරතුරු මගින් විවිධ කාර්ය සිදු කරනු ලබන යන්ත්‍ර පරිගණක ලෙස හැඳින්වේ. එමගින් ලිපි, පින්තූර, වීඩියෝ, පැතුරුම්පත් සහ දත්ත පාද මත ඇති තොරතුරු නැරඹීමට, සවන්දීමට සහ සංස්කරණය කිරීමට ඔබට ඉඩ සලසා දෙනු ලැබේ.

ගොඩනැංවීමේ පහසුවට සහ එහි විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා පරිගණකයෙහි සෑම දෙයක් ම අගය දෙකක් මගින් නිරූපණය කරනු ලබයි.

පරිගණකය ඕනෑම දෙයක් අවස්ථා දෙකකින් නිරූපණය කරනු ලබන අතර, මෙම අගයන් 1 සහ 0 මගින් ඔබ දැක තිබෙනු ඇත.

බිටු සහ ද්විමය

පරිගණකය දත්ත තැන්පත් කිරීම සඳහා 1 සහ 0 යන ද්විමය සංඛ්‍යාංක භාවිත කරයි. binary digit (ද්විමය සංඛ්‍යාංකය), එසේත් නැත හොත් bit (බිටුව) පරිගණනයේ භාවිත කරනු ලබන කුඩා ම ඒකකයි.

ද්විමය සංඛ්‍යා සෑදී ඇත්තේ ද්විමය සංඛ්‍යාංක මගින්,

උදාහරණ: ද්විමය සංඛ්‍යා **1001**

පරිගණකය on සහ off යන ඉලෙක්ට්‍රොනික් සංඥා භාවිත කරන බැවින් සෑම දෙයක් ම 1 සහ 0 ශ්‍රේණියක් මගින් නිරූපණය කෙරේ. දත්ත නිරූපණය කිරීම 1 සහ 0 යන අනුක්‍රමය මගින් සිදු කරනු ලැබේ.



රූපය 1.2. 1 ද්විමය 10101000 යන සංඛ්‍යාව 1 හා 0 යන ඉලක්කම් (විවෘත හෝ සංවෘත) අනුක්‍රමයක් ලෙස නිරූපණය කර ඇත.

පරිගණකය මගින් සකසා ගැනීමට අවශ්‍ය සියලුම දත්ත මෙම ද්විමය ආකෘතියට පරිවර්තනය කළ යුතු ය.

බිටු සහ බයිට
භාවිතයේ පහසුව සඳහා බිටු පහත ආකාරයෙන් කාණ්ඩගත කළ හැකිය

- **Nibble** - 4 bits (half a byte)
- **Byte** - 8 bits (A group of 8 bits is called a byte)
- **Kilobyte** (KB) - 1024 bytes
- **Megabyte** (MB) - 1024 kilobytes
- **Gigabyte** (GB) - 1024 megabytes
- **Terabyte** (TB) - 1024 gigabytes

අංකයක් හෝ අනුලක්ෂණයක් නිරූපණය කිරීම සඳහා පරිගණකය බිටු 8ක් (බයිට 1ක්) භාවිත කරයි.

දත්ත නිරූපණය

පරිගණකය තුළ පවතින සියලු දත්ත on සහ off නම් වූ ඉලෙක්ට්‍රොනික සංඥා මාලාවක් මගින් සම්ප්‍රේෂණය වේ.

එබැවින් පරිගණකය මගින් ක්‍රියාවලියට ලක් කළ යුතු වචන, පින්තූර, හඬ ඇතුළු ඕනෑ ම ආකාරයේ දත්තයක් ද්විමය ස්වරූපයට පරිවර්තනය කළයුතු ය.

රූපය 1.2. 2 පාඨ, පින්තූර, සහ ශබ්ද වැනි දත්ත ද්විමය සංඛ්‍යා බවට පත් කළ විට



රූපය 1.2. 3 'A' නම් අක්ෂරය ද්විමය බවට පරිවර්තනය

පරිගණකයේ පාඨ (text) නිරූපණය

යතුරු පුවරුවක යම් යතුරක් එබූ විට සකසනය මගින් එය ද්විමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කර යතුරුලියනය කරන ලද අනුලක්ෂණය පරිගණක තිරය මත ප්‍රදර්ශනය කරයි.

'A' අක්ෂරයට අදාළ ද්විමය සංඛ්‍යාව 0100 0001 වේ.(මෙය දශමය සංඛ්‍යයා 65 වේ)

සංඛ්‍යාවක එක් එක් අනුලක්ෂණයක් නිරූපණය කිරීමට යොදා ගන්නා කේතය යම් පාඨයක් ද්විමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කිරීම සඳහා යොදා ගත හැකි ය. ASCII කේතනය මේ සඳහා යොදා ගත හැකි එක් කේතයකි. ASCII කේතනය යතුරු පුවරුව මත ඇති එක් එක් අනුලක්ෂණය ගෙන එයට අදාළ ද්විමය සංඛ්‍යාවක් පවරා දෙනු ලැබේ.

උදාහරණයක් ලෙස:

- 'a' අක්ෂරයට අදාළ ද්විමය සංඛ්‍යාව 0110 0001 වේ.(මෙය දශමය සංඛ්‍යා 97 වේ)
- 'b' අක්ෂරයට අදාළ ද්විමය සංඛ්‍යාව 0110 0010 වේ. (මෙය දශමය සංඛ්‍යා 98 වේ)
- 'c' අක්ෂරයට අදාළ ද්විමය සංඛ්‍යාව 0110 0011 වේ. (මෙය දශමය සංඛ්‍යා 99 වේ)

ASCII කේතනය මගින් අනුලක්ෂණ 128ක් පමණක් ගබඩා කළ හැකි වේ. මෙය ඉංග්‍රීසි භාෂාව සඳහා ප්‍රමාණවත් වුව ද ඇතැම් භාෂා සඳහා ප්‍රමාණවත් නොවේ. ජපන්, චීන, මැන්ඩරීන් වැනි විශාල අක්ෂර මාලාවක් සහිත භාෂා භාවිත කිරීම සඳහා අනුලක්ෂණ විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ. එම නිසා Unicode නම් වූ වෙනත් කේතනයක් නිර්මාණය කර ඇත. මෙයින් අදහස් කරන්නේ විවිධ භාෂා භාවිත කරන අයට පරිගණකය පරිහරණය කළ හැකි බවයි.

පරිගණකයේ රූප නිරූපණය

පික්සලය නම් වූ කුඩා තිත් මගින් පරිගණක තිරය මත ග්‍රාෆික නිර්මාණය කරනු ලබයි. තිරය මත දැක්වෙන පික්සල ප්‍රමාණය වැඩි වන විට විභේදනය ඉහළ වන අතර, පින්තූරයේ ගුණාත්මක භාවය ද ඉහළ යයි. එමෙන් ම පින්තූරයේ විභේදනය ඉහළ යන විට එය ගබඩා කිරීම සඳහා වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වේ.



රූපය 1.2. 4 පින්තූරයක විභේදනය ඉහළ යන විට ගුණාත්මක භාවය ඉහළ යන ආකාරය.

බිටුසිතියම් (Bitmaps)

පික්සලය නම් වූ වර්ණිත චතුරස්‍ර සංවිධානය කිරීමෙන් බිටුසිතියම් පින්තූර නිර්මාණය කර තිබේ. මෙම බිටුසිතියම් පින්තූර විශාලනය කිරීමේදී ඒවා දිගු වී විශාල කුට්ටි බවට පත් වේ. මේ හේතුව මත බිටුසිතියම් පින්තූර විශාලනය කිරීමේ දී ඒවායේ ගුණාත්මක බව පහළ යයි.

පොදු බිටුසිතියම් පින්තූර ගොනු වර්ග ලෙස JPEG, GIF සහ PNG දැක්විය හැකි ය.

1 = කළු /on සහ 0 = සුදු /off ලෙස සලකනු ලබන්නේ නම් ද්විමය සංඛ්‍යා යොදා ගනිමින් කළු-සුදු පින්තූරයක් නිර්මාණය කළ හැකි ය.

ඉහත උදාහරණයට අනුව නිර්මාණය කර ගත් පින්තූරයක් පහත පරිදි වේ.



0	0	0	1	1	0	0	0
0	0	1	0	0	1	0	0
0	0	1	0	0	1	0	0
0	1	0	0	0	0	1	0
0	1	1	1	1	1	1	0
0	1	0	0	0	0	1	0
1	0	0	0	0	0	0	1
1	0	0	0	0	0	0	1

පින්තූරයේ වර්ණ නිරූපණය

පින්තූර සඳහා කළු සහ සුදු වර්ණ යොදන ආකාරය මෙතෙක් සාකච්ජා කළ ද බොහෝ පින්තූර සඳහා වර්ණ යෙදිය යුතු වේ.

- පික්සලයක් සඳහා 1 බිටුවක් (0 හෝ 1) : වර්ණ දෙකක්
- පික්සලයක් සඳහා බිටු 2ක් (00 හෝ 11) : වර්ණ හතරක්
- පික්සලයක් සඳහා බිටු 3ක් (000 හෝ 111) : වර්ණ අටක්
- පික්සලයක් සඳහා බිටු 4ක් (0000 හෝ 1111) : වර්ණ දහසයක්
- පික්සලයක් සඳහා බිටු 16ක් (0000 0000 0000 0000 හෝ1111 1111 1111 1111) : වර්ණ 65000කට වැඩි

පරිගණකයේ ශබ්ද නිරූපණය

පරිගණකය යොදා ගනිමින් සැකසීම සිදු කිරීම සඳහා ශබ්ද ද්විමය **සංඛ්‍යා** බවට පරිවර්තනය කළ යුතුය. මේ සඳහා මයික්‍රෆෝනයක් යොදා ගනිමින් ශබ්ද ග්‍රහණය කර ගෙන අනතුරුව **සංඛ්‍යාංක සංඥා** බවට පරිවර්තනය කළ යුතුය.

ශබ්ද තරංගවල සෑම මොහොතක ම අගයයන් නියැදි ලක්ෂ්‍යයන් මගින් ලබා ගත හැකි ය.



රූපය 1.2.5 ශබ්ද තරංගයක්

.

Time	1	2	3	4	5	6	7	8	9	10
value	8	3	7	6	9	7	2	6	6	6
Binary value	1000	0011	0111	0110	1001	0111	0010	0100	0110	0110

නිපුණතාව 2 : මෙහෙයුම් පද්ධතිය සමග කාර්යක්ෂමව හා ඵලදායිවව පරිගණක භාවිත කරයි.

නිපුණතා මට්ටම 2.1 : සැකසුම් කිරීම සහ වින්‍යාසකරණය (configuring) සඳහා මෙහෙයුම් පද්ධති භාවිත කරයි.

කාලය : කාලච්ඡේද 02

ඉගෙනුම් පල :

- සැකසුම් කිරීම: දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති සැකසුම් කරයි.
- ගොනු ගුණාංග සැකසීම : පඨන මාත්‍ර, සැඟවුණු, පිහිටීම, ප්‍රමාණය සැකසුම් කරයි.
- දිගුව (extension) සමග ගොනු සොයයි.

අන්තර්ගතය

- ප්‍රදේශීය සැකසීම (Regional settings) : දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති
- ගොනු ගුණාංග
- ගොනු සෙවීම

අවධානය යොමු කළ යුතු වදන් සහ සංකල්ප:

- මෙහෙයුම් පද්ධතියේ සැකසීම්
- ගොනු ගුණ නියම කිරීම
- ගොනු දිගු

පාඩම් සැලසුම් සඳහා මග පෙන්වීම:

- පරිගණකයෙහි Regional settings සඳහා පිවිසීමට උපදෙස් දීම.
- ගොනු ගුණාංග පිළිබඳ සාකච්ඡා කිරීම.
- ගොනු දිගු හඳුනා ගැනීම සඳහා උපදෙස් දීම.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඔවුන්ට විවිධ ගොනු වර්ග ලබා දී සොයා ගැනීම් පන්තියට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දීම.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා, පරිගණකයෙහි ප්‍රදේශීය සැකසීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ පැවරුමක් ලබා දීම.
- පරිගණකය තුළ ඇති විවිධ වර්ගයේ ගොනු සොයා ගෙන ඒවායේ වර්ගය අනුව ගොනු වර්ගීකරණය සිදු කර තම කණ්ඩායමේ පිළිතුරු පන්තියට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දීම.

ගුණාත්මක යෙදවුම්:

- පරිගණක, අන්තර්ජාල පහසුකම්, විවිධ වර්ගයේ ගොනු වර්ගවල එකතුවක්
- https://www.cnet.com/how-to/windows-10-settings-menu-the-time-language-tab/

කියවීම් ද්‍රව්‍ය

වින්ඩෝස් 10හි Country or Region Home Location වෙනස් කිරීම

මගින් රට, ප්‍රදේශය සහ නිවෙස පිහිටි ස්ථානය පිළිබඳ දත්ත වෙනස් කිරීම.

ඔබේ පරිගණකයෙහි Country or Region Home Location වෙනස් කිරීම සඳහා

1. Windows 10හි settings icon මත click කර, අනතුරුව Time & language icon මත click කරන්න.
2. වම් පස ඇති ලැයිස්තුවෙන් Region & language යන්න තෝරා, දකුණු පස ලැයිස්තුවෙන් තමා ජීවත් වන රට (නිද: Sri Lanka) තෝරන්න (පහත තිර පින්තූරය බලන්න).
3. ඔබට දැන් Setting කවුළුව වසා දැමිය හැකිය.



රූපය 2.1.1 සැකසීමේ කවුළුව



රූපය 2.1.2 රට හෝ කලාපය සහ භාෂාව තේරීමේ කවුළුව



රූපය 2.1.3 රට තේරීම

වින්ඩෝස් 10 මෙහෙයුම් පද්ධතිය තුළ දිනය සහ වේලාව වෙනස් කිරීම

Settings හි දිනය සහ වේලාව වෙනස් කිරීමට

1. Settings කවුළුව විවෘත කර, Time & language icon මත click කරන්න

2. වම් පස ඇති ලැයිස්තුවෙන් Data & Time යන්න තෝරා දකුණු පස ලැයිස්තුවෙන් තමා ජීවත් වන රට තෝරා ගැනීම සඳහා එම රටට අදාළ වේලා කලාපය තෝරා ගන්න.

3. දිනය සහ වේලාව දැක්වෙන ආකෘතිය මත click කරන්න.

4. දිනය සහ වේලාව වෙනස් කරන්න.

5. Setting කවුළුව වසාදමන්න.



රූපය 2.1.4 කාල කලාපය තේරීම



රූපය 2.1.5. දිනය සහ වේලා අකෘතිය තේරීම

වින්ඩෝස් 10හි මුදල් වර්ගය වෙනස් කිරීම

Windows 10හි මුදල් වර්ගය වෙනස් කරන ආකාරය

Settingsහි මුදල් වර්ගය වෙනස් කිරීම සඳහා

1. Settings කවුළුව විවෘත කර Change date, time or number formats icon මත click කරන්න
2. Region කවුළුව තුළ ඇති Additional Settings බොත්තම මත click කරන්න.
3. Currency තීරුව තෝරාස මුදල් වර්ගයට අදාළ සංකේතය යතුරුලියනය කරන්න. (උදාහරණයක් ලෙස Rs.) අනතුරුව Apply බොත්තම සහ OK බොත්තම click කරන්න.
4. ඔබට දැන් Setting කවුළුව වසාදැමිය හැකි ය.



රූපය 2.1.6. සැකසීමේ කවුළුව



රූපය 2.1.7. දිනය සහ වේලා සැකසීමේ කවුළුව



රූපය 2.1.8. මුදල් වර්ගය තේරීමේ කවුළුව

වින්ඩෝස් 10හි සංඛ්‍යා ආකෘතිය වෙනස් කිරීම

Settingsහි සංඛ්‍යා ආකෘතිය වෙනස් කිරීම සඳහා

1. Settings කවුළුව විවෘත කර Change date, time or number formats icon මත click කරන්න.

2. Region කවුළුව තුළ ඇති Additional Settings බොත්තම මත click කරන්න.

3. Numbers තීරුව තෝරා දශමය සංකේතය යතුරුලියනය කරන්න. (උදාහරණයක් ලෙස (“.”), අනතුරුව Apply බොත්තම සහ OK බොත්තම click කරන්න.

4. ඔබට දැන් Setting කවුළුව වසා දැමිය හැකි ය.



රූපය 2.1. 9 සංඛ්‍යා ආකෘතිය තේරීමේ කවුළුව

ගොනුවක ගුණ සකස් කිරීම

ගොනුවක් සැඟවීම

1. File Explorer විවෘත කරන්න
2. ඔබට සැඟවීමට අවශ්‍ය ගොනුව වෙතට යන්න.
3. ඔබට සැඟවීමට අවශ්‍ය අයිතමය මත right click කර, එහි properties මත click කරන්න.
4. General පටිත්තෙහි Attribute යටතේ ඇති Hidden යන්න පරීක්ෂා කරන්න.
5. Apply බොත්තම මත click කරන්න.



රූපය 2.1. 10 ගොනු ගවේෂක (File Explorer) කවුළුව



රූපය 2.1. 11 රහස් ගොනු ගුණාංග කවුළුව

6. මෙහිදී ඔබ ගොනු සහ අනෙකුත් ෆෝල්ඩර ද සැඟවීමට බලාපොරොත්තු වන්නේ නම් Apply changes to this folder, subfolders, and files යන්න තෝරන්න.
7. OK click කරන්න.



රූපය 2.1.11 උපලක්ෂණ වෙනස්කම් තහවුරු කිරීමේ කවුළුව

8. කාර්යය සම්පූර්ණ කිරීම සඳහා OK නැවතත් Click කරන්න.

සඟවන ලද ගොනු සහ ෆෝල්ඩර නැවත දෘශ්‍යමාන කිරීම

File explore විවෘත කරන්න, View පටිත්ත මත click කර, Hidden item විකල්පය තෝරන්න. එවිට ඔබට සාමාන්‍ය පරිදි අදාළ ගොනු වෙත පිවිසිය හැකිවේ.

ඔබට විවෘත කිරීමට අවශ්‍ය වන ගොනුව හෝ ෆෝල්ඩරයට අදාළ ගොනු මාර්ගය යතුරුලියනය කර, Enter බොත්තම තද කරන්න.

නිද: C:\Users\admin\Desktop\Files\Secret Files\My School.ppt



රූපය 2.1.12 සඟවන ලද ගොනු සහ ෆෝල්ඩර නැවත දෘශ්‍යමාන කිරීම

ගොනු සෙවීම

ගොණු දිගුව, දිනය සහ ප්‍රමාණය මගින් ගොනු සෙවීම

1. File Explorer විවෘත කර Search box මත click කරන්න.
2. ගොනු වර්ගය, ප්‍රමාණය, යාවත්කාලීන කරන ලද දිනය සහ අනෙකුත් ගුණාංග මගින් සෙවුම් සිදු කිරීමට හැකි වන පරිදි සෙවුම් මෙවලම් කවුළුව තුළ පෙන්නුම් කරයි.
3. මීට අමතරව දකුණු පස ඇති search box තුළ සෙවුම් කිරීමට අවශ්‍ය නිර්ණායකය යතුරු ලියනය කරන්න.

උදාහරණ ලෙස:

1. File name – Ex : ICT Grade 8
2. Size - Ex : 25MB
3. Type - Ex : .pfd
4. Date Created – 2017/10/23
5. Date Modified – 2017/11/22
6. Author - CHAMARI
7. Location - Colombo



රූපය 2.1.13 ගොනු ගවේෂක කවුළුව



රූපය 2.1 14 විස්තර තේරීම

නිපුණතාව 2 : මෙහෙයුම් පද්ධතිය සමග කාර්යක්ෂමව හා ඵලදායිව පරිගණක භාවිත කරයි.

නිපුණතා මට්ටම 2.2: පරිගණකවල මූලික දෝෂාවේක්ෂණය සහ නඩත්තු කිරීමේ ක්‍රමවේද (දෘඩාංග සහ මෘදුකාංග) ගවේෂණය කරයි.

කාලය : කාලච්ඡේද 02

ඉගෙනුම් පල :

- දෘඩාංග දෝෂ ගවේෂණය කර, අදාළ දෝෂ විසඳීම සිදු කරයි.
- මෘදුකාංග දෝෂ ගවේෂණය කර, අදාළ දෝෂ විසඳීම සිදු කරයි.

අන්තර්ගතය

- සරල පරිගණක දෝෂ ගවේෂණය.
- දෘඩාංග දෝෂ (යතුරුපුවරු, මූසික, විදුලිබල රැහැන්, ජාලකරණ රැහැන්, VGA රැහැන්)
- ශබ්ද ප්‍රතිදාන දෝෂ (ස්පීකර් සම්බන්ධතා, ශබ්ද ප්‍රමාණය පිරික්සීම)
- කෙවෙනි සම්බන්ධ කිරීම (PS/2, USB, Micro USB, VGA, HDMI, Parallel, RJ45, Memory Card Reader)
- පරිගණක මෘදුකාංග දෝෂ ගවේෂණය සහ අදාළ දෝෂ විසඳීම
- දෝෂ සහිත මෘදුකාංග
- හිස් ඩෙස්ක්ටොප්

අවධානය යොමු කළ යුතු වදන් සහ සංකල්ප:

- දෝෂ ගවේෂණය
- පරිගණක දෝෂ
- දෘඩාංග ගැටලු
- කෙවෙනි සම්බන්ධතාව
- විකෘති මෘදුකාංග
- හිස් ඩෙස්ක්ටොප්

පාඩම් සැලසුම් සඳහා මග පෙන්වීම

- දෝෂ නිරාකරණය විස්තර කිරීම
- පරිගණකයේ දෘඩාංග සහ මෘදුකාංග ගැටලු විසඳීම සඳහා උපදෙස් සැපයීම
- දෝෂ නිරාකරණය සහ පරිගණක දෘඩාංග හා මෘදුකාංග ගැටලු විසඳීම සඳහා මාර්ගෝපදේශනය සැපයීම
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා, ඔවුනට විවිධ වර්ගයේ පරිගණක දෘඩාංග හා මෘදුකාංග ගැටලු ඉදිරිපත් කර ලබා ගත් දැනුම භාවිතයෙන් ඒවා විසඳීමට යොමු කිරීම

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්:

- එක් එක් පරිගණකයේ රැහැන් සහ දෘඩාංග සංරචකයන් අහඹු ලෙස ඉවත් කරන්න..
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඔවුන්ට එම පරිගණකයන්ගේ දෘඩාංග හා මෘදුකාංග ගැටලු සොයා ඒවාට විසඳුම් ලබාගන්නා ලෙස පැවරුමක් ලබාදීම

ගුණාත්මක යෙදවුම්:

- පරිගණක දෘඩාංග , අන්තර්ජාල පහසුකම්, අදළ මෘදුකාංග
- https://www.computerhope.com/jargon/t/troushoo.htm

කියවීම් ද්‍රව්‍ය:

දෝෂ නිරාකරණය

පරිගණක ගැටලුවක් විසඳා ගනු ලබන්නේ කෙසේ ද යන්න නිරූපණය කරන ක්‍රියාවලිය දෝෂ නිරාකරණය ලෙස හඳුන්වනු ලැබේ.

පරිගණක දෝෂ නිරාකරණයේ දළ විශ්ලේෂණය

පහත පියවර අනුගමනය කිරීම බොහෝ පරිගණක ගැටලු හඳුනා ගැනීමට උපකාරී වේ.

1. පරිගණකය ක්‍රියාත්මක වී තිබෙන්නේ ද?
2. කිසියම් දෝෂ පණිවිඩයක් පෙන්නුම් කරන්නේ ද?
3. පරිගණකය නැවත ආරම්භ කරන්න.
4. නව මෘදුකාංගයක් හෝ දෘඩාංගයක් එකතු කර තිබෙන්නේ ද?
5. පරිගණකය චලනය කර තිබෙන්නේ ද?
6. යම්කිසි විදුලි බලය ඇනහිටීමක් හෝ විදුලි කුණාටුවක් ඇති වී තිබෙන්නේ ද?
7. නැවත සම්බන්ධ කර විදුලිබල රැහැන් පරීක්ෂා කරන්න.
8. ධාවක (drivers) යාවත්කාලීන කරන්න. නැත හොත් නවතම සරිමාවන් (patches) ස්ථාපනය කරන්න.
9. අනිෂ්ට මෘදුකාංග සහ වයිරස සඳහා පරිලෝකනය කරන්න.
10. කිසිදු ගැටලුවකින් තොරව අවසන් වරට පරිගණකය ක්‍රියාත්මක වූයේ කවරදා ද?
11. වෙනත් පරිගණක දෘඩාංග සහ මෘදුකාංග දෝෂාවේක්ෂණ

පරිගණක දෘඩාංග ගැටලු

- යතුරුපුවරුව
- මූසිකය
- විදුලිරැහැන
- ජාලකරණ රැහැන
- VGA රැහැන

ශබ්ද ප්‍රතිදාන ගැටලු

- ස්පීකර සම්බන්ධතා
- හඬ ප්‍රමාණය පරීක්ෂාව

පරිගණක කෙවෙනි සම්බන්ධතා

- PS/2
- USB
- Micro USB
- VGA
- HDMI
- සමාන්තර
- RJ45
- මතක කාඩ්පත්

රූපය 2.2.1 විදුලි බල රැහැන් සම්බන්ධතාව

අදාළ දෘඪාංග ගැටලු විසඳීම

1. උපාංගය පරිගණකයට සම්බන්ධ වී ඇති බව සැක හැර දැන ගන්න.
2. රැහැන් රහිත උපාංගයක් නම්, බැටරි වෙනස් කිරීමට උත්සාහ කරන්න.
3. සෑම රැහැනක් ම නිසි ලෙස සම්බන්ධ වී ඇති බවට සහතික කර ගන්න
4. උපාංගය ක්‍රියා විරහිත කර, නැවත ක්‍රියාත්මක කරන්න
5. පරිගණකය නැවත අරඹන්න.
6. හඬ ප්‍රමාණය පරීක්ෂා කරන්න.

පරිගණක මෘදුකාංග ගැටලු

1. Blue Screen of Death (BSoD)
2. DLL File අතුරුදන් වීම
3. ස්ථාපනය නොකරන ලද යෙදුම්
4. යෙදුම් සෙමෙන් ධාවනය වීම
5. අසාමාන්‍ය යෙදුම් හැසිරීම
6. මෘදුකාංග වැඩසටහන් ස්ථාපනය කිරීමට නොහැකි වීම
7. ස්ථාපනය අතරතුර සිදු වන දෝෂ

දෝෂ නිරාකරණය සහ අදාළ මෘදුකාංග ගැටලු විසඳීම

1. මෘදුකාංගයේ වෙළුම් පාලන සැකසුම් තහවුරු කර ගන්න
2. ධාවකයන් යාවත්කාලීන කරන්න නැත හොත් අලුතින් ම ස්ථාපනය කරන්න.
3. අනිෂ්ට මෘදුකාංග හා වයිරස සඳහා ස්කෑන් කරන්න

දූෂිත මෘදුකාංග

මෘදුකාංග නිවැරදිව ස්ථාපනය නොකළ හොත් හෝ අනිෂ්ට මෘදුකාංග වැඩසටහන් මගින් ඒවා දූෂිත විය හැකිය. මෘදුකාංග දූෂිත වූ විට එය වැරදි නොමැතිව විවෘත කළ නොහැකි අතර, ඇතැම් අවස්ථාවලදී, ගොනුවක් මගින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් තොරව නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීමට නොහැකි විය හැකිය.

හිස් වැඩතලය

පරිගණකය ක්‍රියාත්මක වන විට තිරය හිස්ව පවතී නම්, එය පරිගණකය හා තිරය අතර සම්බන්ධතාවේ ඇති විය හැකි දෝෂයකි. මෙහි දී පළමුවෙන් ම, මොනිටරය විදුලි කෙවෙනියක් තුළට සම්බන්ධ කර ඇත් දැයි පරීක්ෂා කරන්න. එසේ නම් මොනිටරය සහ පරිගණක දෘඪ තැටිය අතර සම්බන්ධතාව ආරක්ෂිත වේ. මෙම ගැටලුව උකුළු පරිගණකයක(Lap top) නම්, එහි අභ්‍යන්තර කෙවෙනිවල යම් සම්බන්ධතාවෙහි දුර්වලතාවක් විය හැකි බැවින්, වඩාත් පළපුරුදු අයකු ලවා එය සාදවා ගත යුතු වේ.

නිපුණතාව 3 : එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි.

නිපුණතා මට්ටම 3.1 : ලේඛනයක් සකස් කිරීමේ දී වදන් සැකසුම් මෘදුකාංගවල මූලික ක්‍රියාකාරකම් භාවිත කරයි

කාලය : කාලච්ඡේද 6

ඉගෙනුම් පල :

- වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් හැඩසව් ගන්වන ලද ලේඛනයක් පිළියෙල කරයි.
    - සුදුසු පාඨ හැඩසව් කිරීමක් භාවිත කරයි.
    - චිත්‍රක හැසිරවීම සහ සරල හැඩතල අඳියි.
    - දත්ත ඇතුළු කිරීම සඳහා වගු නිර්මාණය කරයි.
    - වගු හැඩසව් කරයි.
    - වගු සංස්කරණය කරයි.
    - අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ පරීක්ෂා කරයි.

අන්තර්ගතය

- ලේඛනයක් පිළියෙල කිරීම, විවෘත කිරීම, ගබඩා කිරීම සහ වැසීම
- පාඨ හැඩසව් කිරීම
- පාඨ, චිත්‍රක, හැඩ, clip art, word art,… ආදි ගොනු/ වස්තු ඇතුළත් කිරීම
- වගුවක් ඇතුළත් කිරීම
- අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ දෝෂ පරීක්ෂා කිරීම
- ලැයිස්තු
- පාඨ හැඩසව් කිරීම
- චිත්‍රක : ඇතුළු කිරීම සහ හැඩසව් කිරීම
- හැඩතල : ඇතුළු කිරීම සහ හැඩසව් කිරීම
- තීරු පළල සහ උස
- මැකීම, ඇතුළු කිරීම, කෝෂ වෙන් කිරීම සහ ඒකාබද්ධ කිරීම
- අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ පරීක්ෂා කිරීම

අවධානය යොමු කළ යුතු වදන් සහ සංකල්ප:

- ලබා ගත හැකි පහසුකම් පිළිබඳ විස්තරයක්: නිර්මාණය, සංස්කරණය, ගබඩා කිරීම, බෙදා ගැනීම, ග්‍රැෆික් භාවිත කිරීම, පිටපත් කිරීම
- පරිශීලක අතුරු මුහුණත හඳුනා ගැනීම
- මෙනු අනුපිළිවෙළ සඳහා කෙටි මාර්ග (Short-cuts) : open, close, save, copy, cut, paste, undo, redo
- විවිධ හැඩතල ගැන්වීම: අකුරු (අකුරු, තදවර්ණය, ඇලකුරු..), ඡේදය (center, right and left alignment, justification, bullets and numbers), පිටු (margins, orientation)
- තීරු පළල නියාමනය
- මාතෘකාවල ශීර්ෂයන් ඉදිරි පිටුවලට අඛණ්ඩව ගෙන යෑම
- අවසන් සංස්කරණය ලෙස සෙල එකතුව
- built-in spellcheck සහ grammar checker තුළ සීමා

පාඩම් සැලසුම් සඳහා උපදෙස්

- මූලික මෙහෙයුම් සඳහා මෘදුකාංගය භාවිත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.
- මූලික මෙහෙයුම් සාකච්ඡා කිරීම සහ ආදර්ශනය
- වදන් සැකසුම් ලියවිල්ලක් විවෘත කිරීම සඳහා විවිධ ක්‍රම: මෘදුකාංගය ද්විත්ව ක්ලික් කිරීම, දකුණු-ක්ලික් කිරීම
- හැඩතල ගැන්වීමේ මෙවලම් ගුරුවරයා ආදර්ශනය කිරීම
- හැඩතල ගැන්වීමේ ක්‍රම ආවරණය සඳහා නිර්මාණය කරන ලද ක්‍රියාකාරකම් පත්‍රිකා සැපයීම
- සන්දර්භයෙන් ඉගෙනගැනීමට ඔවුන්ට අර්ථවත් අභ්‍යාස ලබාදීම
- ගුරුවරයා විසින් වගු සඳහා මෙවලම් ප්‍රදර්ශනය කිරීම
- වගු සමඟ වැඩ කිරීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රියාකාරකම් පත්‍රිකා ලබාදීම
- සන්දර්භයෙන් ඉගෙනගැනීමට ඔවුන්ට අර්ථාන්විත අභ්‍යාස ලබාදීම
